සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade	10 ශ්‍රේණිය	ශිල්ප කලා - I	කාලය / நேரம் / Time	පැය 01යි

නම / பெயர் / Name ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .....

■ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

(01) ශ්‍රී ලාංකේය ජනකලා හැඳින්වීමට ඇති යෙදුම් කිහිපයක් පහත දැක්වේ. ඒ අතරින් නොගැළපෙන යෙදුම තෝරන්න.


1. විවිධ ජීවන වෘත්තීන් හා බද්ධව ඇත.
2. දේශීය සංස්කෘතිය පිළිබිඹු කරයි.
3. පරිසරයට අහිතකර දේශීය අමුද්‍රව්‍ය භාවිතයෙන් බිහි වී ඇත.
4. ජනකලා ආශ්‍රිත නිර්මාණ බිහිවීමට ශිල්පීය දැනුම අවශ්‍ය වේ.

(02) විද්වතුන් ඉදිරිපත් කරන නිර්වචන අතර රටක ස්වාධීනත්වය පිළිබිඹු කරන්නාවූ කැඩපතක් ලෙස දක්වන කලාව වන්නේ,

1. වෙස්මුහුණු කලාව
2. ජන කලාව
3. නැටුම් කලාව
4. පන් පැදුරු කලාව

(03) රූප සටහනින් දක්වා ඇත්තේ,

1. ආයත චතුරස්‍රයකි
2. තුඇපිසියමකි
3. රොම්බසයකි
4. රොම්බාභයකි




(04) A4 ප්‍රමාණයේ ඇඳීමේ කඩදාසියක දිග x පළල මිලි මීටර් කීයද ?

1. 594 x 841
2. 210 x 297
3. 841 x 1189
4. 105 x 148

(05) සෘජුකෝණයක් සම කොටස් 3 කට බෙදීම මෙහි දක්වා ඇත. එහි එක් කොටසක අගය කීයද ?

1. 60^0 කි.
2. 90^0 කි.
3. 30^0 කි.
4. 45^0 කි.



(06) වෘත්තයක කේන්ද්‍රය හරහා ගොස් පරිධියේ ලක්ෂ්‍ය දෙකක් යා කරන සරල රේඛාව හඳුන්වන්නේ කෙසේද ?


1. අරය
2. විශ්කම්භය
3. ජ්‍යාය
4. චාපය

(07) සවිධි ෂඩාස්‍රයක අභ්‍යන්තර කෝණයක් සමච්ඡේදනය කිරීමෙන් ලැබෙන කෝණයක විශාලත්වය කොපමණද?

1. 60^0 කි.
2. 90^0 කි.
3. 120^0 කි.
4. 140^0 කි.

(08) රූපයේ දැක්වෙන ත්‍රිකෝණයේ ABC කෝණය වන්නේ,

1. සුළු කෝණයකි
2. මහා කෝණයකි
3. සෘජු කෝණයකි
4. පරාවර්තන කෝණයකි



Past Papers Wiki

(09) මින් මූලික ඝන වස්තු වලට අයත් නොවන්නේ කුමක්ද ?

1. ප්‍රිස්මය 2. පිරමීඩය 3. කේතුව 4. ත්‍රිකෝණය

(10) අරයන් දෙකකින් හා ඒ තුළ වූ චාපයකින් අන්තර්ගත වූ කොටස හඳුන්වන්නේ කෙසේද ?

1. චාපය 2. කේන්ද්‍රක ඛණ්ඩය 3. විශ්කම්භය 4. ජ්‍යාය

(11) අතීතයේ වර්ණ ලබා ගැනීමට භාවිතා කරන ලද්දේ පාරිසරික සම්පත්ය. මෙහිදී නිල්වර්ණය සාදා ගැනීමට ගන්නා ලද්දේ කුමන ශාකයෙන්ද ?

1. ගොකටු ගසේ කිරි වලින් 2. නිල් අවරිය ගසෙන්
3. මකුළු මැටි භාවිතයෙන් 4. සාදලිංගම් වලින්

(12) වර්ණ ආලේපකරණයේදී තුනී පාරදෘශ්‍ය පදාසයක් ආලේප කිරීම හඳුන්වන නම කුමක්ද ?

1. යටි ආලේපනය නමිනි 2. අඳුරු කරණය නමිනි
3. අධි ආලෝක කරණය නමිනි 4. සේදීම නමිනි


(13) කපු වර්ග අතරින් ඉතාමත් උසස් කපු වර්ගය ලෙස සැලකෙන්නේ,

1. ඇමෙරිකන් අප්ලන් කපු 2. පීරු හෙවත් දකුණු ඇමෙරිකානු කපු
3. පිලර් කපු 4. සී අයිලන්ඩ් කපු


(14) රෙදිපිළි නාක්ෂණයේදී විවිධ කෙඳි වර්ග භාවිතා කර නූල් නිශ්පාදනය කර ගැනේ. ස්වාභාවික සිලික් රෙදි හෙවත් සේද රෙදි නිපදවීමට කෙඳි ලබා ගන්නේ,

1. පට පණු කෝෂ වලිනි 2. ප්ලැක්ස් හණගසේ කෙඳි වලිනි
3. කාශ්මීර එළුවාගේ ලොම් වලිනි 4. ඇස්බැස්ටෝස් නිධි වලිනි


(15) පහත විධිමත් රටා අතරින් ජටා වියමන තෝරන්න.




1.



2.



3.



4.

(16) දික් නූල් හා හරස් නූල් එකිනෙක බැඳීමේදී සිදු වන වෙනස්කම් අනුව විවිධ රටා ගොඩ නැගේ. ප්‍රධාන සම්මත රටා වනුයේ,

1. චාම්, දික්දාර, සැටින් 2. චාම්, සැටින්, රටා 3. චාම්, හීරි, සැටින් 4. චාම්, ජටා, හීරි

(17) කෙඳි පැල්ලම් පරීක්ෂණයට භාජනය කිරීමෙන් හණකෙඳි වලට ලැබෙන වර්ණය වන්නේ,

1. රතු දම් පාට 2. රන්වන් දුඹුරුපාට 3. දුඹුරු පාට 4. දුඹුරු පැහැති දම් පාට

(18) පෙහෙකම් කෙඳි වර්ගීකරණයේදී ප්‍රෝටීන් කෙඳි කාණ්ඩයට අයත් කෙඳි වර්ගය වන්නේ,

1. ජූට්, සීසල්, සේදය 2. සේද, ලෝමය 3. නයිලෝන්, ටෙරිලීන්ය 4. රන්, රිදීය

(19) අලංකාර විසිතුරු පටි වර්ග පහසුවෙන් වියා ගැනීමට ටැබ්ලට් කාඩ් භාවිතා කරනු ලැබේ. ටැබ්ලට් කාඩ් එකක් තුළ නූල් පොටවල් කීයක් යෙදිය හැකිද ?

1. 2 යි 2. 3 යි 3. 4 යි 4. 6 යි

(20) ග්‍රාස් ලිනන් රෙදි විවීමට ගනු ලබන්නේ කිනම් ශාකයේ කෙඳි වර්ගයද ?

1. රැමී 2. සීසල් 3. ෆෙනා 4. මැනිලා

Past Papers Wiki

(21) මැටි නිර්මාණය පිළිබඳ වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

1. පිප්සම් දිරාපත් වී මැටි නිර්මාණය වේ
2. ඇලුමිනා සිලිකේට් දිරාපත් වී මැටි නිර්මාණය වේ
3. ප්ලාස්ටිර් ඔෆ් පැරිස් දිරාපත් වී මැටි නිර්මාණය වේ
4. පාෂාණ දිරාපත් වී මැටි නිර්මාණය වේ

(22) මැටි භාණ්ඩ නිෂ්පාදනයේ දී මැටි වල භෞතික හා රසායනික ගුණ දැන සිටීම ඉතා වැදගත් වේ. මැටි ජලය සමග එක්වීමේදී ඇති වන ඇලෙන සුළු බව හඳුන්වන්නේ,

1. වර්ණය
2. සවිවරතාවය
3. හැකිලීම
4. සුවිකාර්යතාවය

(23) මැටි නිර්මාණය වන ආකාරය අනුව ඒවාට විවිධ පැහැයන් ලැබේ. සුදු වර්ණයක් ගන්නා මැටි වර්ගය වන්නේ,

1. ශේෂ මැටි
2. අගම් මැටි
3. දියළු මැටි
4. ද්විතියික මැටි

(24) කළුතර දෙදියවල පිහිටි මැටි හඳුන්වන නම කුමක්ද ?

1. බෝල මැටි
2. රතු මැටි
3. ගිනි මැටි
4. තලප මැටි

(25) පහත සඳහන් අමුද්‍රව්‍ය වලින් නොඇලෙන සුළු අමුද්‍රව්‍ය නම් කරන්න.

1. මකුළු මැටි
2. ඩොලමයිට්
3. රතු මැටි
4. කෙඔලින්

(26) මැටි තහඩු භාවිතා කර මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීමේදී තහඩු එකිනෙකට සම්බන්ධ කිරීමට භාවිතා කරන්නේ මොනවාද ?

1. ග්‍රොග්
2. ගම්
3. මැටි පාප්ප
4. සෙලෝටේප්

(27) මැටි භාවිතයෙන් ඕනෑම නිර්මාණයක් හෝ රූපයක් අතින් නිර්මාණය කිරීම හඳුන්වන නම කුමක්ද ?

1. ඉදි කිරීම
2. තහඩු භාවිතයෙන් ඉදි කිරීම
3. අච්චු භාවිතයෙන් ඉදි කිරීම
4. ඇඹීම

(28) රූපයේ දැක්වෙන්නේ රෙදි කැබලි අලංකාර කර ගැනීමට යොදා ගන්නා අලංකාර මැහුම් ක්‍රමයකි. එම මැහුම් ක්‍රමය හඳුන්වන්නේ,

1. පිස්මේන්තු මැස්ම ලෙසය
2. බ්ලැන්කට් මැස්ම ලෙසය
3. දම්වැල් මැස්ම ලෙසය
4. හුරුළු කටු මැස්ස ලෙසය



(29) පැච්වර්ක් නිර්මාණයේ දී රෙදි කොටස් එකිනෙකට තබමින් පළමුවෙන් යොදා ගන්නේ ස්ථිර නොවන මැස්මකි. එය හඳුන්වන්නේ කිනම් නමකින්ද ?

1. නැටි මැස්ම ලෙසය
2. නූල් ඇද ගැනීමේ මැස්ම ලෙසය
3. පිස්මේන්තු මැස්ම ලෙසය
4. දම්වැල් මැස්ම ලෙසය

(30) රිබන් එම්බ්‍රොයිඩර් මෝස්තර මැසිමේදී ගැටයක් මෙන් මැස්මක් භාවිතා කරයි. මෙය හඳුන්වන නාමය වන්නේ,

1. ප්‍රංශ ගැටය ලෙසය
2. රිබන් මැස්ම ලෙසය
3. ලූප් ගැටය ලෙසය
4. කෙලින් මැස්ම ලෙසය

(31) පැරණි ශිෂ්ටාචාරවලින් හමු වී ඇති සාධක අනුව පබළු භාවිතයෙන් ඇඳුම් පැළඳුම් අලංකාර කර තිබේ. ඒ සඳහා උදාහරණයකි,

1. මෙසපොතේමියානු පූජකයන්ගේ ප්‍රතිමා
2. දඩයම් යුගයේ හමු වූ චිත්‍ර
3. ඊජිප්තු පිරමීඩවල තැන්පත් කළ මමී
4. මයා ශිෂ්ටාචාරයේ මායාවරුන්ගේ ප්‍රතිමා

(32) නූල් භාවිතා කර අත් රේන්දයක් ගෙතීමට යොදා ගන්නා නූල් කටු වර්ගය හඳුන්වන්නේ,

1. වූල් ගෙතීමේ කටුව ලෙසයි
2. හර්නල් කටුව ලෙසයි
3. තැටින් ගෙතීමේ කටුව ලෙසයි
4. නූල් ගෙතීමේ කටුව ලෙසයි

(33) කඩදාසි ආශ්‍රිත නිර්මාණ කිරීමේදී කඩදාසි පටි රෝල් කිරීම සඳහා ටූලය වෙනුවට යොදාගත හැකි වඩාත් සුදුසු අනුයෝගී උපකරණය වන්නේ,

1. ටූත් පික් එකය
2. පොල් ඉරටුය
3. හැන්දය
4. කතුරය

(34) රිබන් එම්බ්‍රොයිඩර් සඳහා වඩාත්ම සුදුසු රෙදි වර්ගය වන්නේ,

1. කපු ය
2. පොලියස්ටර් ය
3. ලිනන් ය
4. ඕගන්දි ය

(35) ගෙතීමේ මූලික පියවර වන්නේ,

1. දම්වැල ගෙතීම
2. තනිපටි පිරවිල්ල යෙදීම
3. පත්තෑයා පටිය ගෙතීම
4. කුකුළු ගෙතීම

(36) ළදරු තොප්පිය වූල් ආශ්‍රිතව ගෙතීමේදී භාවිතා කළ යුතු ගෙතුම් කටුවේ නොම්මරය වන්නේ,

1. NO / 10
2. NO / 08
3. NO / 5
4. NO / 2

(37) උද්‍යාන අලංකරණයේදී අව් වැසි සුළං ආදියට වඩාත් හොඳින් ඔරෝත්තු දෙන නිශ්පාදන මාධ්‍ය වනුයේ,

1. ලී වේ
2. ප්ලාස්ටර් ඔෆ් පැරිස් වේ
3. පල්ප වේ
4. සිමෙන්ති වේ

(38) උද්‍යාන අලංකරණ නිර්මාණ කිරීමේදී හැඩතල වල පරිමාව නියමිත ප්‍රමාණවලට යොදා ගැනීම හඳුන්වන්නේ,

1. අනුපාතය
2. සමබරතාවය
3. සම්පින්ඩනය
4. විවිධත්වය

(39) සිමෙන්ති මාධ්‍යයෙන් බිතු කැටයමක් නිර්මාණය කිරීමේදී සිමෙන්ති කුඩු වැලි සමග මිශ්‍ර කළ යුතු අනුපාතය,

1. 1 : 4
2. 1 : 5
3. 1 : 1
4. 1 : 2

(40) පල්ප මාධ්‍යයෙන් මූර්ති නිර්මාණය කිරීමේදී කෘමි සතුන්ගෙන් ආරක්ෂා වීම සඳහා භාවිතා කරනු ලබන්නේ,

1. පල්මානික්කම්
2. බයින්ඩර් ගම්
3. පාන් පිටි
4. සායම්

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library

Past Papers Wiki

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය தரம் Grade	10 ශ්‍රේණිය	**ශිල්ප කලා - II**	කාලය நேரம் Time	පැය 02යි

නම பெயர் Name ..... විභාග අංකය சுட்டிலக்கம் Index No. .....

- **පළමු ප්‍රශ්නය ඇතුළු තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් සමග ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. ඔබ පාසලේ මෙවර පැවැත්වෙන නිවාසාන්තර මලල ක්‍රීඩා උත්සවයේ විසිතුරු කිරීමේ අවස්ථා සියල්ල ශිල්ප කලා අංශයේ සිසුන් වෙත පැවරීමට ක්‍රීඩා කමිටුව තීරණය කර ඇත.

(i) ක්‍රීඩා උත්සවයේ නිවාස සැරසීම සඳහා යොදාගනු ලබන අමුද්‍රව්‍ය 04 ක් නම් කරන්න.

(ii) ක්‍රීඩා උත්සවය පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීමට සුදුසු පෝස්ටරයක ආකෘතියක් ඇඳ දක්වන්න.

(iii) නිවාස වල නම සකස් කිරීම සඳහා වියමන් රටා මගින් සැකසීමට සුදුසු පන් වර්ග දෙකක් හෝ පත්‍ර වර්ග දෙකක් සඳහන් කරන්න.

(iv) පැරකුම් නිවාසයේ සිසුන් හඳුනාගැනීම සඳහා සුදුසු ලාංඡනයක් ඇඳ දක්වන්න.

(v) තූර්ය වාදක කණ්ඩායමේ සාමාජිකයන් සඳහා ගෙළ පැළඳීම සඳහා මාලයක් සැදීමට සුදුසු ස්වභාවික ඇට වර්ග දෙකක් සඳහන් කරන්න.

(vi) සරඹ සංදර්ශනයේ සිසුන්ගේ ඇඳුම අලංකාර කිරීම සඳහා සුදුසු සිදුරු තහඩු මුද්‍රණයක රූප සටහනක් ඇඳ දක්වන්න.

(vii) ඔබ පාසලේ නිවාසාන්තර ක්‍රීඩා උළෙල සඳහා සුදුසු තේමා පාඨයක් ලියා දක්වන්න.

(viii) උත්සව අවස්ථාව සඳහා සුදුසු පොල්තෙල් පහනක ආකෘතියක් ඇඳ දක්වන්න.

(ix) අලංකරණ කටයුතු සඳහා මල් සැකසිය යුතු අතර වෘත්තාකාර හැඩයේ මල් වර්ග 4ක් සඳහන් කරන්න.

(x) දක්ෂතම ක්‍රීඩකයින්ට කුසලතා පිරිනැමීම සඳහා සුදුසු කුසලානයක ආකෘතියක් ඇඳ දක්වන්න.

(ල.20)

02. ජ්‍යාමිතික උපකරණ නිවැරදි ක්‍රම ශිල්ප අනුව භාවිත කිරීමෙන් නිර්මාණ ක්‍රියාවලියෙහි සාර්ථකත්වය ලැබිය හැකිය.

(i) 6cm දිග රේඛාවක් ඇඳ එය සමාන කොටස් 05 කට බෙදා දක්වන්න. (ල.03)

(ii) වෘත්තයක් ඇඳ පහත සඳහන් කොටස් ලකුණු කර පෙන්වන්න.
1. වෘත්ත පාදය
2. වෘත්ත ඛණ්ඩය
3. පරිධිය
4. කේන්ද්‍රය
(ල.04)

(iii) අරය 30mm වන වෘත්තයක් තුළ සවිධි ෂඩාස්‍රයක් අඳින්න. (නිර්මාණ රේඛා පැහැදිලිව තිබීම වැදගත් වේ) (ල.03)

Past Papers Wiki

03. නිෂ්පාදිත රෙදිපිළි වර්ණ ගැන්වීමට පෙර ඊට සූදානම් කිරීම සඳහා පෙර පිරියම් ක්‍රියාවලියට ලක් කළ යුතු වේ.

(i) නිෂ්පාදිත රෙදි වල ස්වභාවිකව හා බාහිරව එක් වූ අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා කරනු ලබන පෙර පිරියම් ක්‍රම 03 ක් සඳහන් කරන්න. (ල.03)

(ii) රෙදිපිළි අලංකරන ක්‍රම 3 ක් සඳහන් කරන්න. (ල.03)

(iii) අච්චු මුද්‍රණය සඳහා සුදුසු ස්වභාවික අච්චු වර්ග 3 ක් නම් කර ස්වභාවික අච්චුවක රූප සටහනක් ඇඳ දක්වන්න. (ල.04)

04. දික් නූල් සහ හරස් නූල් අතුරෙන් එකිනෙක බැඳීමෙන් විවීම සිදුවේ.

(i) චාම් වියමන් රටාවෙහි ඒකක 02 ක් ඇඳ පෙන්වන්න. (ල.04)

(ii) ජටා වියමන් රටාවෙන් වියනු ලබන රෙදි වර්ග 03 ක් සඳහන් කරන්න. (ල.03)

(iii) සේද කෙඳි ලබා ගන්නා පටපණු වර්ග තුන හා එක් එක් පටපණුවා ආහාරයට ගන්නා කොළ වර්ගය ලියා දක්වන්න. (ල.03)

05. මැටි භාණ්ඩ නිෂ්පාදනයේ දී විවිධ ක්‍රමවලට මැටි මිශ්‍රණ සකස් කර ගනී.

(i) පදම් මැටි උපයෝගී කර භාණ්ඩ නිෂ්පාදනය කරනු ලබන ක්‍රම 03 ක් සඳහන් කරන්න. (ල.03)

(ii) මැටි දරණු උපයෝගී කර භාණ්ඩයක් නිර්මාණය කරන ආකාරය රූප සටහනක් ඇඳ විස්තර කරන්න. (ල.04)

(iii) මහා පරිමාණ කර්මාන්ත ශාලා වල දී යන්ත්‍රානුසාරයෙන් මැටි පදම් කරනු ලබන යන්ත්‍ර වර්ග 03 ක් ලියා දක්වන්න. (ල.03)

06. වර්ණ රෙදි කැබලි ආශ්‍රයෙන් විවිධ විසිතුරු නිර්මාණ කිරීම අද ජනප්‍රිය ගෘහ කර්මාන්තයක් බවට පත්ව ඇත.

(i) පැච්වර්ක් නිර්මාණයක් සඳහා සුදුසු නිර්මාණයක් ඇඳ දක්වන්න. (ල.04)

(ii) රිබන් එම්බ්‍රොයිඩර් සඳහා භාවිත කරනු ලබන මැහුම් ක්‍රම 03 ක් ලියා දක්වන්න. (ල.03)

(iii) පැච්වර්ක් නිර්මාණයක් සඳහා අවශ්‍ය ද්‍රව්‍ය උපකරණ 06 ක් සඳහන් කරන්න. (ල.03)

07. මිනිසා ජීවත් වන වටපිටාව අලංකාරව තබා ගැනීමට ගත් උත්සාහයක් පිළිබඳ සාධක පැරණි ශිෂ්ටාචාරවලින් ලැබී ඇත.

(i) උද්‍යාන අලංකරණ මූර්ති සඳහා භාවිත කළ හැකි මාධ්‍ය 03 ක් සඳහන් කරන්න. (ල.03)

(ii) උද්‍යාන අලංකරණ නිර්මාණ කිරීමේ දී ශිල්පියෙකු විසින් අවධානය යොමු කළ යුතු උද්‍යාන විද්‍යා මූලධර්ම 03 ක් ලියා දක්වන්න. (ල.03)

(iii) පොකුණක් අසල තැබීමට සුදුසු උද්‍යාන මූර්තියක දළ රූප සටහනක් ඇඳ දක්වන්න. (ල.02)

(iv) කඩදාසි පල්ප සකස් කර ගන්නා ආකාරය පියවර වශයෙන් ලියා දක්වන්න. (ල.02)

PAST PAPERS WIKI
WWW.PastPapers.Wiki

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library